# SRI LANKA ASSOCIATION BERLIN E.V.

Sri Lanka Association Berlin e.V- Gardeschützenweg 86-12203 Berlin

2014 මාර්තු 06

යුරෝපයේ පළමු වරට, රූප රැජිණ තේරීමේ තරගයක් 2014 වසරේ ජුනි මස 01දා,පැරිස් නුවර දී පැවැත් වීමට, ප්‍රංශයේ ශ්‍රී ලංකා සුබසාධක සංගමය කටයුතු පිළියෙල කර ඇත. පියා හෝ මව ශ්‍රී ලාංකික උත්පත්තිය ඇති, වයස අවුරුදු 16 - 27 ත් අතර, යුරෝපයේ වෙසෙන කාන්තාවන් සඳහා මෙම තරගය විවෘත ය. සෑම තරගකාරියකටම සාරි සහ අනෙකුත් ඇඳුම් පැළඳුම්, සිහිවටනයන් ඇතුළුව දින තුනක් පැරීසියේ ගත කිරීමට පහසුකම් නොමිළයේ සැපයෙන අතර, ජයග්‍රාහිකාවන්ට ඉතා වටිනා ත්‍යාගයන් පිරිනැමෙයි. පැරීසියේ පැවැත්වෙන මෙම රූප රැජිණිය තේරීමේ තරගය ප්‍රංශයේ සහ ශ්‍රී ලංකාවේ රූපවාහිනී මාධ්‍යය ඔස්සේ ප්‍රචාරය කෙරේ.

යුරෝපයේ සෑම රටකින්ම තරගකාරියන් දෙදෙනෙකු හෝ තිදෙනෙකු බැගින් මෙම තරගයට ඉදිරිපත් කෙරෙනු ඇත. ජර්මනිය නියෝජනය කරනු ලබන තරගකාරියන් තෝරා ගැනීම, 2014 අප්‍රේල් 12 වන දින, බර්ලින් - ශ්‍රී ලංකා සංගමයේ අනුග්‍රහයෙන් පැවැත්වෙන නව අවුරුදු උළෙලේ දී සිදු කෙරේ. එහිදී තේරී පත් වන  පළමු සහ දෙවන ජයග්‍රාහිකාවන් දෙදෙනාට පැරීසියේ පැවැත්වෙන තරගාවලියට සහභාගී වීම සඳහා යෑමට අවශ්‍ය ගුවන් බලපත්‍ර, බර්ලින් ශ්‍රී ලංකා සංගමය විසින් පිරිනැමේ.

මෙම තරගය සඳහා උනන්දුවක් දක්වන, වයස අවුරුදු 18 - 33 දක්වා ඕනෑම කාන්තාවකට මේ සමඟ ඇති පෝරමය පුරවා එවීමෙන් ඊට අයදුම් කළ හැකිය. ජර්මනියේ දී පැවැත්වෙන තරගයේ තරගකාරියන්හට අප්‍රේල් 11 වන දින, අදාළ ජූරි සභිකයින් සමඟ රාත්‍රී භෝජන සංග්‍රහයක් පිළියෙල කරනු ලබන අතර, අප්‍රේල් 12 දින ජූරි සභිකයින් සහ නරඹන්නන් ඉදිරියේ ඔවුන් තරගයට ඉදිරිපත් විය යුතුය. අවසන් තරග වටයේදී, රූප රැජිණිය තේරීම් තරගයන්ට අදාල රෙකුලාසි උපමානයන් අනුව කරනු ලබන විනිශ්චයෙන් ජයග්‍රාහිකාවන් දෙදෙනෙකු තෝරා ගනු ලැබේ.

කාරක සභාව

බර්ලින් ශ්‍රී ලංකා සංගමය